01. වසමේ නම සහ අංකය :- 850 C ගොරකදූව

02. හැඳින්වීම:-

වල්ලලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ දකුණු භාගයේ දකුණු පළාතේ සීමාවේ පිහිටා ඇත. මෙම කොට්ඨාශය උතුරින් අගලවත්ත හා මතුගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලින්ද දකුණු දෙසින් බෙන්තර ගඟින් ද මායිම් වන අතර , දකුණු පළාත් සීමාවෙන්ද (ගාල්ල දිස්ත්‍රික්කය) නැගෙනහිර නියාගම සහ අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලින්ද මායිම් වන වර්ග කිලෝමීටර් 210.6 කින් යුත් භූමි භාගයකි.

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අතුරින් පොදු පහසුකම් ඒඅණ ග්‍රාම නිලධාරී වසම් 60 න් එක් වසමක් වන 850 C ගොරකදූව ග්‍රාම නිලධාරී වසමට අයත් වන ප්‍රදේශ වන්නේ බටගොඩ ,ගොරකදූව, මිරිස්වත්ත, සේද සංකීර්ණය,හේන් යාය, නාමල්ගම, නැදුන්වත්ත, ජන උදාන ගම්මානය යන ගම්මාන වල එකතුවයි. මෙහි පවුල් 527 ක් ජීවත් වන අතර මුළු ජනගහනය 1904 ක් පමණ වේ.

මෙම ග්‍රාම නිලධාරී වසමට අයත් සමස්ථ භූමි ප්‍රමාණය අක්කර 429 ක් වන අතර වී අක්කර 190 ක් ද, තේ අක්කර 180 ක් ද ,රබර් අක්කර 2 ක් ද ,පොල් අක්කර 20 ක් ද කුරුඳු අක්කර 30 ක් ද, මිශ්‍ර බෝග අක්කර 75 ක් ද, ගෙවතු අක්කර 12 කින්ද සමන්විත වේ. කඳුකර භූමියකින් යුක්ත වන මෙම වසමෙහි ජීවත් වන ජනතාව මිශ්‍ර භෝග වගාව තුලින්ද මීට අමතරව ප්‍රධාන ජීවනෝපාය ලෙස වී ගොවිතැනෙහි නියලෙති.

නම හැදුන ආකාරය :-

ගොරකදූව ග්‍රාම නිලධාරී වසම ගම් කාණ්ඩ කිහිපයක් එකතු වී සෑදුන ග්‍රාම නිලධාරී වසමකි. ජනප්‍රවාදයේ සඳහන් වන්නේ ගොරකදූව යනුවෙන් නම සෑදි ඇත්තේ මේ ආකාරයටය. මිනිසුන් විසින් ජනාවාස තනාගෙන ජීවිත් වී ඇති අතර ඔවුන් ජීවත් වූ ප්‍රදේශය ගොරක ගොඩැල්ල වත්ත ලෙස ව්‍යවහාර වී ඇත. පසු කලක ඔවුන්ගේ ජනාවාස ව්‍යාප්ත වීමක් සමඟ ජීවනෝපාය මාර්ග වැඩි වීමත් සමඟ ඔවුන් විසින් භාවිතා කළ" ගොරක ගොඩැල්ල වත්ත " ටික කලක් ගත වූ පසු ගොරකදූව ලෙස භාවිතා වූ බවය.

ගමන් මාර්ගය :-

මතුගම පැලවත්ත ගමන් මාර්ගයේ පැලවත්ත හංදියෙන් 2 Km පමණ ගමන් ගන්නා විට ගොරකදූව හංදිය හමුවේ.ගොරකදුව හංදියේ සිට නෙළුව මාර්ගයේ 1 Km පමණ දුරකින්ද මෙම ග්‍රාම නිලධාරී වසමට ප්‍රවේශ විය හැකිය.

❖ **ජනගහන තොරතුරු :-**

ස්ත්‍රී	පුරුෂ	එකතුව
981	923	1904

ආගම් අනුව

	ස්ත්‍රී	පුරුෂ
බෞද්ධ	980	923
හින් දු	-	-
කිස්ත්‍රියානි	01	-
ඉස්ලාම්	-	-
එකතුව	981	923

- ❖ භූමියේ ස්වාභාවය :- තැනිතලා
- ❖ පස් වර්ගය :- මැටි පස

ආයතන අනුව රැකියා නියුක්තිය

රැකියාවේ නියතු අංශය	සංඛ්‍යාව		
	ස්ත්‍රී	පුරුෂ	එකතුව
රජයේ පළාත් පාලන අංශය	32	09	41
රජයේ ආරක්ෂ සේවය	2	18	20
අර්ධ රාජ්‍ය සේවය	-	-	-
පෞද්ගලික අංශය	55	110	165
ස්වයං රැකියා	44	140	184
විදේශ රැකියා	12	08	20
වෙනත්	3	25	28
එකතුව	148	310	458
කාර්මික	-	15	15
කෘෂිකාර්මික	169	310	479
සේවා	200	100	300
එකතුව	369	425	779

රජයේ කාර්යාල

- ✓ රජයේ ග්‍රාම නිලධාරි කාර්යාලය
- ✓ තේ ව්‍යාපෘති නිලධාරි කාර්යාලය
- ✓ පැලවත්ත යුධ හමුදා කඳවුර
- ✓ ගොවි ජන සේවා මධ්‍යස්ථානය
- ✓ රබර් ව්‍යාපෘති නිලධාරි කාර්යාලය
- ✓ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය
- ✓ සංවර්ධන නිලධාරි කාර්යාලය
- ✓ සමෘද්ධි නිලධාරි කාර්යාලය
- ✓ කෘෂි පර්යේෂණ නිලධාරි කාර්යාලය